# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2022/27 - 2017 ජුනි මස 07 වැනි බදාදා - 2017.06.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

එල්.ඩී.බී. 6/77 (ii)

**1977 අංක 8 දරන උද්දර්පණ නීතිය**

3 වන වගන්තිය යටතේ නියමය

1977 අංක 8 දරන උද්දර්පණ නීතියෙහි 3(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, මෙම නියමය මගින් පහත සඳහන් ලෙස, එනම්, අපරාධ නඩු පැවරීමට යටත් පුද්ගලයන් සහ දඬුවම් නියම වූ තැනැත්තන් හුවමාරු කිරීම පාලනය කරනු ලබන සහ හසුරුවනු ලබන ද්වීපාර්ශවික යාන්ත්‍රණයක් පිහිටුවීම සඳහා සහ අපරාධ වැළැක්වීම සහ එම අපරාධ සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීමෙහි ලා තත් ගිවිසුමේ රාජ්‍ය පාර්ශවයන් අතර සහයෝගය වර්ධනය වන අයුරින් යුක්තිය පසිඳලීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම ද සඳහා 2015 මැයි මස 28 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ විදේශීය රාජ්‍යයක් වන රුසියානු ෆෙඩරේශනය අතර සෙන්ට් පීටර්ස්බර්ග් හිදී උද්දර්පණ ගිවිසුමක් අත්සන් කළ බැවින් ද, එක් රාජ්‍ය පාර්ශවයක් අනෙක් රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලීමක් කරන ලද විට හා ගිවිසුමේ වගන්තිවලට යටත්ව දඬුවම් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අදාළ පාර්ශවයන්ගේ දේශසීමා තුළදී සොයාගන්නා ලද අපරාධ නඩු පැවරීමට යටත් පුද්ගලයන් සහ දඬුවම් නියම වූ තැනැත්තන්, අනෙක් පාර්ශවය වෙත උද්දර්පණය කිරීමට බැඳී සිටින බැවින් ද, ඉහත කී ගිවිසුමේ වගන්ති 1977 අංක 8 දරන උද්දර්පණ නීතියේ 4 වන වගන්තිය සමග අනුකූල වන බැවින් ද, එකී ගිවිසුමේ සඳහන් යම් සංශෝධනයකට, සීමා කිරීමකට හෝ කොන්දේසියකට යටත්ව එකී 1977 අංක 8 දරන නීතියෙහි වගන්තීන් එකී විදේශීය රාජ්‍යය කෙරෙහි අදාළ වන බව ප්‍රකාශ කරමි.

ජනාධිපතිවරයා.

2017 ජුනි මස 06 වැනි දින,
කොළඹ දී ය.

06 - 814


1A - PG 3554 — 437 (2017/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*